මගේ අංකය 1/1/15//03
පාලන අංශය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගම්පහ
2017.01. 04

(8)

ජී.ඩී.අනුර පියබන්ධු මහතා,

අතිරේක දිස්ත්‍රික් ලේකම්/අතිරේක දිසාපති

ශ්‍රී ලං.ප.සේ. 1,

<u>රාජකාරි පැවරීම</u>

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් ලේකම් ධුරයට අදාල වන පහත සඳහන් රාජකාරි ඉටු කිරීමට ඔබ වෙත පවරමි.

කාර්ය මණ්ඩලයේ ආයතන පරිපාලන හා විනය කටයුතු ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම.

1. නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම පිළිබඳ අධීක්ෂණය හා ඊට අදාල පියවර ගැනීම.
2. මෙම කාර්යාලයේ හා සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලයේ හා ග්‍රාම නිලධාරීන්ගේ ණය ඉල්ලුම් පත්‍ර නිර්දේශ කිරීම හෝ අනුමත කිරීම.
3. කාර්ය මණ්ඩලයේ අතිකාල අනුමත කිරීම හා අවශ්‍ය අවස්ථා වලදී නිර්දේශ ඉදිරිපත් කිරීම
4. ග්‍රාම නිලධාරීන්ගේ
   I. වැඩබැලීමේ පත්වීම් නිර්දේශ කිරීම්
   II. පත්වීම් ස්ථිර කිරීම
   III. සේවා දීර්ඝ කිරීම් වලදී අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම
   IV. නිලධාරීන් සම්බන්ධව විනය කටයුතු ආදී රාජකාරි වලදී නිර්දේශ ඉදිරිපත් කිරීම
5. කාර්යාලයේ ආරක්ෂාව පිළිබඳව අධීක්ෂණය.
6. උප්පැන්න විවාහ මරණ රෙජිස්ට්‍රාර්වරුන්ගේ කාර්යයන් අධීක්ෂණය.
7. මොටර් රථ ප්‍රවාහන අංශයේ රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාල විභාග පැවත්වීම හා අධීක්ෂණය, සහ රියදුරු පුහුණු පාසැල් අධීක්ෂණය.
8. රජයේ දෙපාර්තමේන්තු පළාත් සභා හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණය.
9. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කෘෂිකර්ම, නිවාස, පරිසර, මිළ කමිටු, ඉඩම් පරිහරණ, ආදි කමිටු රැස්වීම් සම්බන්ධීකරණය සහ අධීක්ෂණය.
10. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කටයුතු වලට සහය වීම සහ, ප්‍රසම්පාදන මණ්ඩල කටයුතු සම්බන්ධීකරණය
11. තොරතුරු තාක්ෂණය පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීම, දත්ත රැස්කිරීම හා ගබඩා කිරීම ( SUPER VISION OF THE DATA BASE ) අධීක්ෂණය.
12. අනියම් විස්තීරණ ආපදා යටතේ වන ආපදා සහන සේවා, සමාජසේවා, ගංවතුර, නියං, සුළි සුළං සුනාමි,ආපදා කළමනාකරණ කටයුතු අවතැන් වූවන් සඳහා වියළි සලාක සහනධාර බෙදීම පිසූ ආහාර සැපයීම වැනි කටයුතු අධීක්ෂණය සහ ආපදා කළමනාකරණ අංශය සමග සම්බන්ධීකරණය.
13. ආබාධ සහිත වූවන් පුනරුත්ථාපනය කිරීමේ කටයුතු.

(11)

මගේ අංකය - 01/01/01/03
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ආයතන අංශය
2018.01. 02

ජී.ඩී.අනුර පියබන්දු මහතා
අතිරේක දිස්ත්‍රික් ලේකම්/අතිරේක දිසාපති
ශ්‍රී ලං.ප.සේ.1

## රාජකාරි පැවරීම

ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම්ගේ අංක HAF/1/8/7 හා 2017.07.24 දිනැති ලිපියට අනුව දැනට ඔබට පවරා ඇති රාජකාරි වලට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් පවතින පැරණි ලේඛන සංරක්ෂණය කිරීම පිළිබඳ වගකීම ඔබට මෙයින් කාරුණිකව පවරමි.

ඔබගේ දැන ගැනීම සඳහා අදාල ලිපියේ පිටපතක් මේ සමග අමුණා ඇත.

සුනිල් ජයලත්
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
ස්වදේශ කටයුතු අතිරේක ලේකම්

01/01/01/3
දිස්ත්‍රික් ලේකම කාර්යාලය
ගම්පහ
2018.08.02

ජී.ඩී.අනුර පියබන්දු මහතා
අතිරේක දිස්ත්‍රික් ලේකම්/අතිරේක දිසාපති
ශ්‍රී.ලං.ප.සේ. 1

**01.** රාජකාරී ලැයිස්තුව

2018.06.30 දින පැවති කාර්ය මණ්ඩල රැස්වීමේදී ඔබ වෙත දැනුම් දුන් පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි සියළුම වාහන සම්බන්ධව වගකීම හා එහි අධීක්ෂණ කිරීම් කටයුතු මෙයින් ඔබ වෙත පවරන බව කාරුණිකව දන්වමි.

සුනිල් ජයලත්
දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ
ස්වදේශ කටයුතු අතිරේක ලේකම්